# රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව

## අධ්‍යාපන අමාත්‍යාංශය

## දකුණු පලාත් සභාවේ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම.

දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩු වී ඇති බැවින්, එකී පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පහත සඳහන් සුදුසුකම් සහිත නිලදරීන්ගෙන් දිප ව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්**

I. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I පන්තියේ නිලධාරියෙකු වීම.

II. පූර්වාසන්න වසර 05 තුළ කිසිදු විනය දඬුවමකට යටත් නොවූ සහ පූර්වාසන්න වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**තෝරා ගැනීමේ ක්‍රමය**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් එම කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කරන ලද ලකුණු පටිපාටියක් අනුව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුස්සකු තෝරා ගැනීම සිදු කරනු ලැබේ. මෙම පත් කිරීම සම්බන්ධයෙන් අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව සතුය.

පහත සඳහන් ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පතක් 2017-06-02 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවර "පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය.

**ආදර්ශ අයදුම්පත**

දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. මුලකුරු සමග නම (සිංහලෙන්) මයා/මිය/මෙනවිය.

(ඉංග්‍රීසියෙන්)

2. මුලකුරු වලින් හැඳින්වෙන නම / නම .....

3. 3.1 උපන්දිනය : අවුරුද්ද ..... මාසය ..... දිනය .....

3.2 වයස (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට) : අවුරුදු ..... මාස ..... දින .....

3.3 ආගම .....

3.4 ස්ත්‍රී / පුරුසභාවය : .....

4. 4.1 රාජකාරි ලිපිනය :

4.2 රාජකාරි දුරකථන අංකය : .....

4.3 ස්ථිර ලිපිනය :

4.4 පෞද්ගලික දුරකථන අංකය (ඇත්නම්) : .....

(ලිපි තැපැල් කළ යුතු ලිපිනය X ලකුණෙන් දක්වන්න. පැහැදිලි ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න)

5. ජාතික හැඳුනුම්පත් අංකය :

6. ශ්‍රී ලං.අ.ප. සේවයට පත්වීමේ ස්වභාවය : .....

(විවෘත/සීමිත/ජ්‍යෙෂ්ඨතා කුසලතා/වෙනත් පදනම මත)

7. 7.1 ශ්‍රී ලං.අ.ප.සේ. I පන්තියට උසස් වූ දිනය : .....

7.2 එම උසස්වීම් ලිපියේ අංකය හා දිනය : .....

8. 8.1 දැනට දරන තනතුර හා එම තනතුරට ඔබ පත් කරන ලද ලිපියේ අංකය හා දිනය : .....

8.2 ඉහත පත්වීම අනුව එම තනතුරේ රාජකාරි භාරගත් දිනය

9. අධ්‍යාපන සුදුසුකම් (පශ්චාත් උපාධි ඩිප්ලෝමා / පශ්චාත් උපාධිය / දර්ශනපති / දර්ශන ශූරී) :

| අධ්‍යාපන සුදුසුකම් | පෙනී සිටි මාධ්‍ය | ආයතනය | සහතිකය වලංගු වන දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

10. ලබා ඇති ප්‍රහුණු :

| පාඨමාලාව | පෙනී සිටි මාධ්‍ය | ආයතනය | සහතිකය වලංගු වන දිනය |
|---|---|---|---|
| දේශීය | | | |
| | | | |
| | | | |
| විදේශීය | | | |
| | | | |

11. පාසල් කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද :

| පාසලේ නම | පාසල් වර්ගය (1A, B, 1C, Type 2, Type 3) | පළාත | විදුහල්පති ලෙස කටයුතු කළ කාල සීමාව | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| | | | | |
| | | | | |
| | | | | |

12. කාර්යාල කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද (විදුහල්පති තනතුරු හැර)

| තනතුර | තනතුර අයත් පන්තිය | කාල සීමාව | | පළාත |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| | | | | |
| | | | | |
| | | | | |

13. 13.1 ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ලබා ඇති සුදුසුකම් :

13.2 දෙමළ භාෂාව පිළිබඳව ලබා ඇති සුදුසුකම් :

14. ඔබ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වී ඇත්ද ? වයස අවුරුදු 45 සම්පූර්ණ වීම නිසා නිදහස්වී තිබේද ? එසේ නම් ඒ බව සඳහන් කරන්න.

ම විසින් ඉහත සඳහන් කළ තොරතුරු නිවැරදි බවද, පසුගිය අවුරුදු පහ (5) ඇතුළතදී නියමිත වැටුප් වර්ධක මවිසින් උපයා ගෙන ඇති බවද, කිසිදු විනයානුකූල දඬුවමකට භාජනයවී නොමැති බවද සහතික කරමි.

දිනය : ..... .....

අයදුම්කරුගේ අත්සන

**ආයතන ප්‍රධානියාගේ / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය**

අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, පුවත්පත් දැන්වීමේහි සාමාන්‍ය සුදුසුකම් යටතේ වන අවශ්‍යතාවයන් සපුරා ඇති බවත්, දැනට මෙම අයදුම්කරුට විරුද්ධව කිසියම් විනය පරීක්ෂණයක් නොපැවැත්වෙන බවත්, උසාවියකින් දඬුවම් ලබා නොමැති බවත්, මෙයින් සහතික කරමි.

දිනය : ..... .....

ආයතන ප්‍රධානියාගේ / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන

**පළාත් අධ්‍යාපන ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බවටත්, මෙම අයදුම්කරුට විරුද්ධව කිසියම් විනය පරීක්ෂණයක් නොපැවැත්වෙන බවටත් සහතික කරමි. මෙම නිලධාරියා / නිලධාරිනිය උක්ත තනතුර සඳහා තෝරා පත් කරගනු ලැබුවහොත් රාජ්‍ය සේවයෙන් / පළාත් රාජ්‍ය සේවයෙන් අනුප්‍රාප්තිකයකු රහිතව නිදහස් කිරීමට එකඟ වෙමි / නොවෙමි.

දිනය : ..... .....

අත්සන

(පළාත් අධ්‍යාපන ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල මුද්‍රාව)

**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ නිර්දේශය (වෙනත් පළාත්වල නිලධාරීන් සඳහා)**

මෙම නිලධාරියා / නිලධාරිනිය උක්ත තනතුර සඳහා තෝරා පත් කර ගනු ලැබුවහොත් මෙම පළාත් රාජ්‍ය සේවයෙන් අනුප්‍රාප්තිකයෙකු රහිතව නිදහස් කිරීමට එකඟ වෙමි/නොවෙමි.

දිනය : ..... .....

අත්සන

(පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ගේ නිල මුද්‍රාව)

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි**

**ලේකම්,**
**අධ්‍යාපන අමාත්‍යාංශය,**
**ඉසුරුපාය, බත්තරමුල්ල.**
**2017-05-19**

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී යොදා ගැනීමට අනුමත ලකුණු පරිපාටිය.

**1. සේවා පළපුරුද්ද** — **උපරිම ලකුණු 30**

(ශ්‍රී ලං.අ.ප.සේ. I පන්තියට උසස් වූ දින සිට එක් වසරකට ලකුණු 03 බැගින්)

**2. අධ්‍යාපන සුදුසුකම්** — **උපරිම ලකුණු 10**

- පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ලකුණු 03
- පශ්චාත් උපාධිය - ලකුණු 05
- දර්ශනපති (M Phil) - ලකුණු 07
- දර්ශන ශූරී (PhD) - ලකුණු10

(කාර්යක්ෂමතා කඩඉම්වලින් නිදහස් කිරීමට සලකා බලන ලද සුදුසුකම් සඳහා මේ යටතේ ලකුණු ලබා දෙනු නොලැබේ).

**3. පළපුරුද්ද** — **උපරිම ලකුණු 20**

3.1 පාසල් කළමනාකරණයේ පළපුරුද්ද - ලකුණ10

- 1 ඒ බී පාසලක විදුහල්පති තනතුරක (එක් වසරකට ලකුණු 2 බැගින් උපරිම ලකුණු 10)
- 1 සී හා වර්ගය 2 හා 3 පාසලක විදුහල්පති තනතුරක (එක් වසරකට ලකුණු 1 බැගින් උපරිම ලකුණු 10)

3.2 කාර්යාල කළමනාකරණයේ පළපුරුද්ද - ලකුණු 05

(විදුහල්පති තනතුරක හැර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වෙනත් තනතුරක එක් වසරක සේවා කාලයක් සඳහා ලකුණු 01 බැගින්)

3.3 දකුණු පළාත තුළ සේවා පළපුරුද්ද - ලකුණු 05

(වසරකට ලකුණු 01 බැගින්)

(නියමිත බලධාරීන් විසින් නිකුත් කර ඇති පත්වීම් ලිපි සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

**4. නිර්මාණශීලීත්වය හා වෘත්තීය සංවර්ධන** — **උපරිම ලකුණු 10**

4.1 ඉටු කර ඇති පර්යේෂණ - ලකුණු05

(උපාධිය හෝ පශ්චාත් උපාධිය සඳහා කළ පර්යේෂණ හැර)

4.2 ප්‍රකාශයට පත් කර ඇති සඟරා, ලිපි, ප්‍රකාශන ආදිය - ලකුණු 05

**5. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම** — **උපරිම ලකුණු 05**

- ඩිප්ලෝමාවක් සඳහා (පැය 720 කට හෝ මාස 06 කට නොඅඩු) - ලකුණු 05
- සහතිකපත්‍ර පාඨමාලාවක් සඳහා (පැය 360 කට හෝ මාස 03 කට නොඅඩු) - ලකුණු 03

(උපරිම සුදුසුකමට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.)

**6. භාෂා ප්‍රවීණතාවය** — **උපරිම ලකුණු 10**

6.1 භාෂා ප්‍රවීණතාවය (ඉංග්‍රීසි)

- අ.පො.ස. (උ/පෙළ) හෝ උපාධිය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයක් වශයෙන් හදාරා සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම - ලකුණු 05
- ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය ලබා තිබීම - ලකුණු 04
- අ.පො.ස. (සා.පෙළ) විශිෂ්ට සාමාර්ථය - ලකුණු 03
- අ.පො.ස. (සා.පෙළ) සම්මාන සාමාර්ථය - ලකුණු 02

(උපරිම සුදුසුකමට පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.)

**6.2 භාෂා ප්‍රවීණතාවය (දෙමළ/සිංහල)**

- අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී ප්‍රධාන භාෂාව වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. - ලකුණු 05
- අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී දෙවන භාෂාව වශයෙන් සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම. - ලකුණු 03
- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා පරීක්ෂණයේ 1 වන හෝ 2 වන මට්ටම සමත්ව තිබීම - ලකුණු 03
- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා පරීක්ෂණයේ 3 වන මට්ටම සමත්ව තිබීම හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී දෙවන භාෂාව වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම. - ලකුණු 02
- අ.පො.ස. (සා.පෙළ) විභාගයේ වෛකල්පිත විෂයක් ලෙස සාමාර්ථයක් ලබා තිබීම - ලකුණු 01

(සටහන - ලබා ඇති ඉහලම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. දෙමළ භාෂාව සඳහා ලකුණු ලබා දෙනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් සේවයට බැඳුනු නිලධාරීන්ට වන අතර, සිංහල භාෂාව සඳහා ලකුණු ලබා දෙනු ලබන්නේ දෙමළ මාධ්‍යයෙන් සේවයට බැඳුනු නිලධාරීන්ටය.)

**7. සේවා ඇගයීම් / ප්‍රශංසා සහතික / සම්මාන සහතික / ජයග්‍රහණ** — **උපරිම ලකුණු 05**

(පොදු ආකෘතිපත්‍ර අංක 230 බී මගින් ලබා දී ඇති ප්‍රශංසා / සේවා ඇගයීම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.)

**8. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය** — **උපරිම ලකුණු 10**

(සේවා විවිධත්වය / තනතුරට අදාළ පළපුරුදුකම් හා වෙනත්)